කොත්මලේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කොත්මලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ලංකා බැංකුවේ පුඩළුඔය ශාඛාවේ පවත්වාගෙන ගොස් තිබුණු අංක 71562716 දරන ජංගම ගිණුමේ රු.113,816 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ගිණුම්වලින් මඟහැරී ඇති බව පිළිගනිමි. |
| (ii) | ආදායම් ණයගැති ශේෂය තුළ සාවද්‍ය ලෙස බිල්කළ රු.18,600 ක ජල ගාස්තු සහ රු.29,989 ක අක්කර බදු ඇතුළත්ව පැවතුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ණයගැති ශේෂ කපාහැරීම සඳහා විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළත් මෙතෙක් අනුමැතිය නොලැබුණි. අනුමැතිය ලද පසු ගිණුමෙන් ඉවත් කරමි. |
| (iii) | ජංගම නොවන වත්කම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායකවීමේ ගිණුම අතර රු.4,339,807 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ශේෂ පත්‍රය තුලනය වූ අතර මෙවැනි වෙනසක් සොයාගත නොහැකිය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.761,000 ක ගෙවිය යුතු විගණන ගාස්තු වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | විගණන ගාස්තු සඳහා ගිණුම් දෙකක් ඇති අතර විගණන ගාස්තු වෙන් කිරීමේ ගිණුමෙන්, ගෙවන ලද මුදල අඩුනොවී ඇති බැවින් මෙම වෙනස පෙන්නුම් කරයි. 2020 ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. |
| (v) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී වත්කම් හා වගකීම් ද්‍රවශීලතා අනුපිළිවෙළට ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි මූල්‍ය ප්‍රකාශන සැකසීමේදි වත්කම් හා වගකීම් ද්‍රවශිලතාව අනුව ඉදිරිපත් කරමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාලයක් ඉක්මවා හිඟහිටි වටිනාකම රු.5,253,349 ක් විය. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂය 2011 වර්ෂයේ සිට පැවත එන අතර ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂයක් ඉක්මවා ගෙවිය යුතු ශේෂ දෙකක එකතුව රු.8,396,141 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | කර්මාන්ත ණය හිමි ශේෂය තුළ රැඳවුම් මුදල්ද ඇතුළත් වන අතර පරික්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරන අතර විශ්‍රාම වැටුප් බිල්පතේ මුදලින් රු.50,000 බැගින් මාසිකව ගෙවමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත | මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර තිබියදී නීති විරෝධි ලෙස ගවඝාතකාගාරය | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ගවමස් කඩය මඟින් වර්ෂයකට මිලියන 2 කට අධික ආදායමක් සභාවට ලැබෙන බැවින් මෙය වසා දැමීමෙන් ආදායම් අහිමි වීමේ අවදානමක් පවතී. මධ්‍යම |

| | | |
|---|---|---|
| | පවත්වාගෙන යමින් පැවතුණි. | පරිසර අධිකාරියේ උපදෙස් අනුව කටයුතු කර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු 35,169,328 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,359,070 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිග ආදායම්
-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. කෙසේ වුවද එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී නොසැසඳීම් පවතින බවද නිරීක්ෂණය විය.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,902,000 | 5,051,858 | 3,418,229 | 1,633,630 | 4,229,000 | 4,404,781 | 3,217,500 | 1,187,281, |
| කුලී | 4,501,000 | 4,652,465 | 4,651,248 | 138 | 3,960,000 | 3,706,357 | 3,596,357 | 110,000 |
| බලපත්‍ර ගාස්තු | 13,222,000 | 4,226,866 | 4,226,866 | - | 9,304,000 | 3,317,119 | 3,317,119 | - |
| වෙනත් ආදායම් | 6,265,000 | 3,674,910 | 3,411,407 | 263,503 | 15,968,000 | 21,590,999 | 21,590,999 | - |
| | 28,890,000 | 17,606,099 | 15,707,750 | 1,897,271 | 33,461,000 | 33,019,256 | 31,721,975 | 1,297,281 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32 සිට 80 දක්වා වූ රීතිවල විධිවිධාන අනුව කටයුතුකර නොතිබුණි. | සියළු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම හිඟ ආදායම්වලින් කොටසක් අයකර ඇත. කොටසක් කපා හැරීමට කටයුතු කරමින් පවතින අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.1,661,486 ක් හා ඉඩම් හුවමාරු මුද්දර ගාස්තු රු.5,281,160 ක් අයවිය යුතුව තිබුණි. | අදාළ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වනවිට හිඟයෙන් කොටසක් ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම (Out Come) ලබා නොගැනීම.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 අගෝස්තු 09 දින වන විට ප්‍රාදේශීය සභාවේ නව දෙමහල් ගොඩනැගිල්ලේ පළමු අදියර ඉදිකිරීම් සඳහා රු.11,112,792 ක මුදලක් වැයකර තිබුණි. නමුත් සභාව සතුව ප්‍රමාණවත් අරමුදල් පැවතියද එහි ඉතිරි වැඩ කොටසේ ඉදිකිරීම් 2020 අප්‍රේල් වන විටද ආරම්භ කර නොතිබීම හේතුවෙන් යොදවා ඇති මහජන මුදල්වලින් ප්‍රතිලාභ ලැබීම ප්‍රමාදවීම සහ අනාගත මිල ගණන් ඉහළයාමේ අහිතකර ප්‍රතිවිපාකයන්ට මුහුණදීමේ තත්ත්වයක් ඇතිවී තිබුණි. | ව්‍යාපෘතිය ඉක්මනින් නිමකරවා ගැනීමට කටයුතු කළයුතු වේ. | පළමු අදියර අවසන් කර දෙවන අදියර සඳහා ඇස්තමේන්තුවක් ලබාදෙන ලෙස පළාත් පාලන කොමසාරිස් මඟින් මධ්‍යම පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීම් කර ඇතත් මේ වන තෙක්ම ඇස්තමේන්තුව ලැබී නොමැති බැවින් ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| (ii) | රම්බොඩ දිය ඇල්ල සංචාරක ආකර්ශනීය ස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.5,648,141 ක මුදලකට කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර අදාළ සංවර්ධන කටයුතු 2019 ජනවාරි 21 සිට 2019 ජුනි 19 දක්වා කාලය අතරතුර ඉටු කිරීමට ගිවිසුම්ගතව තිබුණි. 2020 පෙබරවාරි 20 දින වන විටත් නියමිත සංවර්ධන කටයුතු නිමකොට නොතිබුණි. | ව්‍යාපෘතිය ඉක්මනින් වැඩ නිමකර ආදායම් උත්පාදනය කළ යුතු වේ. | මේ වනවිට 80% පමණ වැඩ අවසන් අතර 2020.07.30 වන විට සම්පූර්ණයෙන්ම වැඩ නිම කරන බව කොන්ත්‍රාත්කරු පොරොන්දු වී ඇත. |

(ආ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශය තුළ එකතුකරනු ලබන කසළ කොස්ගහපතන සහ හපුගස්තලාව විවෘත භූමිවලට බැහැර කර තිබූ අතර පොලිතීන් ඇතුළු මිශ්‍ර කසළ විධිමත් පරිදි බැහැර කිරීමක් සිදුකර නොතිබුණි. | විධිමත්ව කසළ කළමනාකරණ කටයුතු කළ යුතු වේ. | කසළ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන තිබෙන ඉඩම අත්පත් කර ගැනීමට අවශ්‍ය සියළු කටයුතු යොදා ඇති අතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉඩම අත්කරදුන් වහාම මෙම ගැටළුව විසඳීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ රදාගල්බඩ හා මීන් ජල යෝජනා ක්‍රම දෙකක් සඳහා 2017 වර්ෂයේදී පිළිවෙළින් රු.1,897,315 ක් හා රු.1,083,915 ක් වැයකර ජල නල මිළදීගෙන තිබුණද අදාළ ජල යෝජනා ක්‍රම ආරම්භකර නොතිබුණි. | සුදුසු ඉඩමක් පවරාගෙන ජල යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | මීන් ජල යෝජනා ක්‍රමය මඟින් ජලය ලබාදීමට යෝජිතව පැවති ඒකක සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ජල පහසුකම් ලබාදී ඇති අතර රදාගල්බඩ ජල යෝජනා ක්‍රමයේ ජල ගබඩා ටැංකිය ඉදි කිරීමට සුදුසු ඉඩමක් නොමැති බැවින් සුදුසු ඉඩමක් පවරාගෙන ඉදිරි කටයුතු කරමි. |
| (ආ) | 2016 වර්ෂයේ දී රු.859,070 ක වියදමක් දරා ඉදිකර තිබුණු තවලන්තැන්න පොදු වැසිකිළිය සඳහා ජල පහසුකම් ලබාදී නොතිබීම නිසා පරිහරණය කිරීමට නොහැකිව පැවතුණි. | ජල සැපයුම ලබාදී වැසිකිළිය ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත් කළ යුතු වේ. | අදාළ වැසිකිළි 2020 වර්ෂය සඳහා ටෙන්ඩර් මඟින් බදු දිමට දැන්වීම් පළකළද ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවූ අතර ජල සැපයුම යථාවත් කර සුදුසු පුද්ගලයෙකු තෝරාගෙන බදු දීමට කටයුතු කරමි. |

3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රු.658,416 ක වියදමක් දරා කොත්මලේ නව නගරයේ පොළ භූමිය වටා ආරක්ෂක වැටක් ඉදිකිරීමට කටයුතුකර තිබුණු අතර, එහි දැනට වසර කිහිපයකට පෙර, සතිපොළ පැවැත්වීම සඳහා ඉදිකර තිබුණු ගොඩනැගිලි කිහිපයක් හා පොදු වැසිකිලිය කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව වල් බිහිවී නිෂ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්ය දේපළ ප්‍රයෝජනයට ගතහැකි ආකාරයට සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | පොදු වැසිකිලිය තුළ මේ වනවිට නොදිරන අමුද්‍රව්‍ය ගබඩා කිරීමට භාවිතා කරන අතර අදාළ අළුත්වැඩියා කටයුතු සිදුකර නව නගරයේ සති පොළ එම ස්ථානයේ පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 193 අනුව අයවැයගත ආදායම් වියදම් සහ සත්‍ය ආදායම් වියදම් අතර විචලනයට හේතු පැහැදිලි කරන ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන රීතී ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදි මූල්‍ය ප්‍රකාශන සමඟ විචලනයට හේතු සහිත ප්‍රකාශයක් ඉදිරිපත් කරමි. |